# කොවිඩ් 19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. COVID-19 සම්ප්‍රේෂණය වැළැක්වීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

MINISTRY OF HEALTH AND INDIGENOUS MEDICAL SERVICES

World Health Organization

GOVERNMENT MEDICAL OFFICERS ASSOCIATION

SRI JAYAWARDENEPURA KOTTE MUNICIPAL COUNCIL

# 46.සංචාරක කර්මාන්තය හා හෝටල්

සංචාරක කර්මාන්තය විවිධ සේවාවන් රාශියක් සහිත පොදු ක්‍රියාකාරකම් රාශියකින් සමන්විත වේ. පහත සඳහන් අංශ වෙත වෙන් වෙන්ව සකසන ලද උපදෙස් සටහන් මෙහිදී අදාළ වේ.

1) අවන්හල්
2) සම්මේලන හා සම්මන්ත්‍රණ පැවැත්වීම
3) කුලී රථ සේවා භාවිතය
4) ත්‍රී රෝද රථ භාවිතය
5) රාජ්‍ය හා පෞද්ගලික වාහන නවත්වන ස්ථාන භාවිතය
6) කසළ ඉඅවත්කරන්නන්, වීදි පිරිසිදු කරන්නන් සහ පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය
7) ආරක්ෂක නිලධාරීන්
8) පිහිණුම් තටාක හා මුහුදු වෙරළ භාවිතය
9) මධ්‍යසාර හා දුම්කොළ නිෂ්පාදන අළෙවිසැල්
10) ළමා හා මහජන උද්‍යාන
11) ගෘහස්ථ ක්‍රීඩා
12) ගෘහස්ථක්‍රීඩාංගණ
13) පුද්ගලික සහ රජයේ කායිාල පරිශ්‍ර
14) වෙළඳසැල්

- හෝටල් විවෘත කිරීම රජයේ අවසරයට යටත් වේ.
- සියළුම විදේශීය අමුත්තන්ට නවාතැන් සැපයීම, COVID-19 පාලනය කිරීම සඳහා නිරෝධායන ක්‍රියා පටිපාටිවලට අනුකූලව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන කොන්දේසි සහ මාර්ගෝපදේශයන්ට යටත් වේ.
- සියළුම විදේශ සංචාරකයින්ට, රෝහල් ගතකිරීම් / ප්‍රතිකාර වියදම් ආවරණය සඳහා සෞඛ්‍ය හා සංචාරක රක්ෂණයක් තිබිය යුතුය.

**නිශ්චිත උපදෙස්**

**සේවායෝජකයින්**

- සියළුම සේවකයින්ට, විවිධ ස්ථාන/අවස්ථා වලදී ගත යුතු පියවර පිළිබඳව නිවැරදි උපදෙස් දෙන්න.
- සියළුම සේවකයින් සහ අමුත්තන්ගේ (නවාතැන් ගන්නා හෝ නොගන්නා) හඳුනාගැනීමේ තොරතුරු හා දුරකථන අංක තොරතුරු සටහන් පවත්වා ගත යුතුය.
- ආයතනයේ සියළුම සේවකයින්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව නිතිපතා සහතික කළ යුතුය.
- සියළුම සේවාදායකයින්ගේ සෞඛ්‍ය තත්ත්වය, ඇතුළුවීමට පෙර සහ ඉන් පසුව දෛනිකව තහවුරු කර ගැනීමට ආයතනය වගබලා ගත යුතුය.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම හිමිකරුගේ / භාරකරුගේ වගකීම වේ.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

- ජනමාධ්‍ය, සමාජ මාධ්‍ය භාවිතයෙන් අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීම.
- විදේශ කටයුතු අමාත්‍යාංශය සහ සංචාරක අමාත්‍යාංශය හරහා ලබා දිය හැකි මාර්ගෝපදේශ.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.